## III කොටස

6. එක් මාතෘකාවකට කරුණු **පහක්** ඇතුළත් වන සේ පහත සඳහන් මාතෘකා **හතරක්** පිළිබඳ අවශ්‍ය උදාහරණ සහිතව විස්තර කරන්න.

(i) ගායන සමය

(ii) හාත්බණ්ඩේ පඩිතුමා

(iii) කවිකාර මඩුව

(iv) සංගීතඥ බීතෝවන්

(v) කර්ණාටක සංගීතය

(vi) චතුරංග ගායන ශෛලිය

(ලකුණු 05 × 4 = 20 යි.)

7.



(i) ඉහත සඳහන් අපරදිග ස්වර ප්‍රස්තාරයට අදාළ ස්කේලය (scale) නම්කර ටයිම් සිග්නේචරය (time signature) ලියා දක්වන්න. (ලකුණු 02 යි.)

(ii) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iii) එම පෙරදිග ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iv) අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ සම්පූර්ණ ගැලීම් සටහනක් සකස්කර, එහි වර්ග **හතරකට** පමණක් අදාළ වන සංගීත භාණ්ඩ **තුන** බැගින් ලියන්න. (ලකුණු 10 යි.)

8. (i) (a) ශ්‍රී ලංකාවේ ග්‍රැමෆෝන් සංගීතය

(b) ශ්‍රී ලංකාවේ චිත්‍රපට සංගීතය

(c) ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය

ඉහත සඳහන් මාතෘකා අතුරින් **එකක්** තෝරාගෙන උදාහරණ සහිත ව වෙන වෙන ම විස්තරයක් කරන්න.

ඔබ තෝරාගත් මාතෘකාව දෙස විස්තර කිරීම සඳහා පහත සඳහන් කරුණුවලින් **හතර** බැගින් ද අදාළ කරගන්න.

* ආරම්භය
* අනුකාරක සභා
* ස්වතන්ත්‍ර නිර්මාණ
* ගායනා කළ කණ්ඩායම් හෝ ගායක ගායිකාවන්
* සංගීත ආභාස, වාද්‍ය භාණ්ඩ හා තාක්ෂණික මෙවලම්
* පද රචනාවන්හි විශේෂතා

(ලකුණු 16 යි.)

(ii) සිංහල බසින් රචිත ඔබ කැමති ඕනෑම සරල ශාස්ත්‍රීය ගීතයක් තෝරා ගෙන, එහි දැක්වෙන ශාස්ත්‍රීය ලක්ෂණ **හතරක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

* * *

www.artsapi.lk